කුරුවිට තරුණියක් ඝාතනයේ හා සැකකරු දිවි තොර කරගැනීමේ සිදුවීමට පසුගිය සතියේ සිටම පුළුල් මාධ්‍ය ප්‍රචාරණයක් ලැබී තිබිණි. කෙසේ නමුත්, සිදුවීමෙන් පසු දෙවෙනි සතිය වන විටත් ඇතැම් මාධ්‍ය එම ඝාතනයට ලක්වූ තරුණියගේ ඡායාරූපය සිය පුවත් වාර්තාවන් සමගින් භාවිතා කරමින්, ඊට ප්‍රසිද්ධියක් ලබාදීමට කටයුතු කරමින් සිටී.

මෙම සිදුවීමේ ස්වභාවයද සමගින් ගෙන බැලූ විට, නැවත නැවතත් ඇගේ ඡායාරූපය ප්‍රකට කිරීම ඔස්සේ මියගිය අයට අගෞරවයක් සිදුවීමත්, ඇගේ පවුලේ අයට සිත්වේදනාවක් ඇති වීමත් ඉවතලිය නොහැකි කාරණාවන් වේ.

එසේම මෙම සිදුවීමට අනවශ්‍ය භාවාතිෂය බවක් එක් වීමටද මෙසේ නැවත නැවතත් ඇගේ ඡායාරූපය භාවිතා කිරීම හේතු නොවන්නේදැයි අප ඇසිය යුතු වේ.

මේ අනුව ගත් විට එය කෙතරම් ආචාර ධර්මානුකූල ක්‍රියාවක්දැයිද අපට ඇසීමට සිදුවේ.

#MediaEthicsSL #lka #SinhalaPress #Lankadeepa #Mawbima #Divaina